# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 9 දරන
# ගොවිජන සේවා (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 06 වන දින]**

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1990 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.**

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිළ : ශත 60 යි. නැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1990 අංක 9 දරන ගොවිජන සේවා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 6 වන දින]

එල්. ඩී.—ඕ. 63/89

1979 අංක 58 දරන ගොවිජන සේවා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත, 1990 අංක 9 දරන ගොවිජන සේවා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන), 1979 අංක 58 දරන ගොවිජන සේවා පනතේ 27 වන වගන්තිය, එහි අගට, මෙහි පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1979 අංක 58 දරන පනතේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

"මේ උපවගන්තියේ කාර්ය සඳහා "සම්බන්ධතාවක්" යන්නට අඳ ගොවියකුගේ "අඳ" අයිතිවාසිකම් ද, ඒ ඉඩමේ බදු ගැනුම්කරුවකුගේ අයිතිවාසිකම් සහ "තට්ටුමාරු" අනුව භුක්ති විඳින ඉඩමක හවුල්කරුවන්ගේ බහුතරයේ අයිතිවාසිකම් ද ඇතුළත් වේ.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ගෙවීම පැහැර හරිනු ලැබුවේ යම් බැංකුවක ද ඒ බැංකුව විසින් නඩු පැවරීම.

29. (1) යම් කෘෂිකාර්මික ඉඩමක උකසක් හෝ බැඳීමක් මත ප්‍රදානය කර ඇති යම් ණය මුදලක් සහ ඒ ණය මුදලේ පොලිය සම්බන්ධයෙන්, මේ කොටසේ විධිවිධාන යටතේ පැහැර හැරීමක් කර ඇති හෝ කරනු ලැබ ඇතැයි සැලකෙන අවස්ථාවක, නියමිත බැංකුව විසින් දැන්වීමක් මගින්, ඒ කෘෂිකාර්මික ඉඩමේ ඉඩම් හිමි ගොවියා හෝ බුක්තිකරු ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් මුදල් ප්‍රමාණය ගෙවීම පැහැර හැර ඇති බව මහේස්ත්‍රාත් අධිකරණය වෙත දැනුම් දිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් දැන්වීම, ඒ කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය පිහිටා ඇති ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණයෙහි ගොනුගත කර තැබිය යුතු අතර ඒ අධිකරණය විසින් එහි සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කළ හැකි දඩ මුදල අයවිය යුතුව ඇතැයි තීරණය කරනු ලබන යම් මුදලක් වෙතොත් ඒ මුදල ඉක්මවිය හැකි වුව ද එය නොතකා, ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් අයකර ගන්නා ආකාරයෙන් ම, අය කර ගත යුතු ය.

(3) සහතිකයේ නිශ්චිතව සඳහන් කර ඇති මුදල, ඒ සහතිකයේ නම් කර ඇති පැහැර හරින්නාගෙන් නියමිත බැංකුවට අය විය යුතු බවට, නියමිත බැංකුව විසින් තත් කාර්යය සඳහා බලය දී ඇති නිලධරයකුගේ අත්සන යටතේ වූ සහතිකයක්, ඒ මුදල ඒ පැහැර හරින්නාගෙන් ඒ බැංකුවට අය විය යුතු බවට, (2) වන උපවගන්තියේ කාර්ය සඳහා බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වන්නේ ය.

(4) පැහැර හරින්නා අඳ ගොවියකු වන්නා වූ ද එකී පැහැර හැර ඇති මුදල (2) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට ආපසු අය කර ගැනීම ප්‍රයෝගිකව කළ නොහැකි හෝ අනවශ්‍යෝචිත බවට නියමිත බැංකුව විසින් කොමසාරිස්වරයාට වාර්තා කරන්නා වූ ද අවස්ථාවක, විධිවිධාන සලසා ඇති ආකාරයට ඒ මුදල ආපසු අය කර ගත නොහැකි බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වුවහොත්, නියමිත බැංකුවට ඒ මුදල ගෙවන තෙක් ඒ පැහැර හරින්නාගේ අඳ අයිතිවාසිකම කොමසාරිස්වරයා විසින් අත්හිටුවිය හැකි ය.

(5) (2) වන උපවගන්තිය යටතේ කවර හෝ අධිකරණයක පවරනු ලබන සියලු නඩු කටයුතු වලට, ඒ අධිකරණයේ අනෙකුත් සියලු කටයුතු අභිභවා ප්‍රමුඛත්වය ලැබිය යුතු අතර, එසේ වුවත්, නියමිත බැංකුව විසින් නඩු කටයුතු පවරනු ලැබීමේ සිට මාස හයක් ඇතුළත අවසන් කළ යුතු ය. ".

ප්‍රධාන **ප්‍රඥප්තියේ 30 වන** වගන්තිය සංශෝධනය **කිරීම.**

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන්,

(2) නැවත අංක යෙදූ (1) වන උපවගන්තියට ඉක්බිතිව මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

" (2) නියමිත බැංකුවක් විසින් ප්‍රදානය කරන ලද යම් ණය මුදලක්, සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ කෘෂිකාර්මික ඉඩමක අයිතිකරු හෝ බුත්තිකරු විසින්, අවශ්‍යතාවෝචිත පරිදි යම් බෝග වැවීම සඳහා හෝ වෙනත් කෘෂි නිෂ්පාදන සඳහා නැතහොත් ගව ආදී සතුන්, ගව ආදී සතුන්ගේ ආහාර හෝ කෘෂිකාර්මික උපකරණ මිල දී ගැනීම සඳහා යොදාගෙන ඇත්තා වූ අවස්ථාවක, ඒ කෘෂි

කාර්මික ඉඩමේ අයිතිකරුගෙන් හෝ බුක්තිකරු ගෙන්, ඒ නියමිත බැංකුවට අය විය යුතු හෝ ඒ අයිතිකරු හෝ බුක්තිකරු විසින් නියමිත බැංකු වට ගෙවිය යුතු ඒ ණය මුදල—

(අ) ඉඩමේ බෝග කෙරෙහි හෝ වෙනත් කෘෂි නිෂ්පාදන කෙරෙහි ; සහ

(ආ) ගව ආදී සතුන්, ගව ආදී සතුන්ගේ ආහාර හෝ කෘෂිකාර්මික උපකරණ කෙරෙහි

ප්‍රථම වැය බරක් විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් ප්‍රථම වැය බරෙහි විෂය වස්තුව සමන්විත වන දේපළ තහනමට ගෙන විකිණීමෙන්, නියමිත බැංකුව විසින්, ඒ ප්‍රථම වැය බර බලාත්මක කළ හැකිය.".

5. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූල තාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවය ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.